# <u>නව සුසමාදර්ශයෙන් ඉතිහාසයට නව එළියක්</u>

ඉතිහාසය පිළිබඳ ව ලියන ලද තවත් ලිපි කිහිපයක් අවසන් කළ යුතු යැයි අදහස් කරමි. මේ ලිපි පෙළෙන් අපි නව සුසමාදර්ශයක් ඉදිරිපත් කෙළෙමු. වංසකතාවල අපේ ඉතිහාසයෙහි යක්ෂ ගෝත්‍රික සංරචකය ඉවත් කෙරී ඇත. අර්ධ වෛදිකයන් මෙරටට පැමිණෙන විට විවිධ ගෝත්‍රිකයෙන් මෙරට සිටි බව වංසකතාවලින් ම පැහැදිලි වෙයි. ඒ අතර යක්ෂ, නාග, දේව, රාක්ෂස ප්‍රධාන වෙයි. එයට අමතර ව වැදි ආදී තවත් ගෝත්‍ර ද වාසය කර ඇත. පණ්ඩුකාභය රජු දවස සිදු වී ඇත්තේ යක්ෂ හා වැදි ගෝත්‍රිකයන් හැරෙන්නට අනෙක් ගෝත්‍රිකයන් සමග අර්ධ වෛදිකයන් එකතු වී සිංහල ජාතිය ගොඩනැගීම ආරම්භ කිරීම ය. වැදි ගෝත්‍රිකයෝ මුළුමනින් ම සිංහල ජාතිය ගොඩනැගීමේ කාර්යයෙන් බැහැර ව සිටි අතර යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් කිහිප දෙනකු එයට සහභාගි වී ඇත. චිත්‍රරාජ, කාළදේව යන නායකයන් ද වාලම්බී වැනි නායිකාවන් ද පඬුඅබා රජුට ආධාර කර ඇත.

වැදි ගෝත්‍රිකයන් සිංහල සමාජයට ඇතුල්වීමට උත්සාහ නොකළ අතර සිංහල ජාතියට විරුද්ධ ව ද ක්‍රියා නො කළහ. ඔවුහු තම ජීවන රටාව වෙනස්කර කෘෂිකාර්මික සංස්කෘතියකට ඇතුල්වීමට උත්සාහ නො කළහ. එහෙත් යක්ෂ ගෝත්‍රියයෝ එසේ නො වූහ. යක්ෂ ගෝත්‍රිකයෝ ද අර්ධ වෛදිකයන් මෙන් ම කෘෂි ජීවන රටාවක් අනුගමනය කළහ. ඔවුන් අර්ධ වෛදිකයන්ගෙන් වෙනස් වූයේ විශේෂයෙන් ම වාපී සංස්කෘතියක් බිහි කිරීමෙනි. අර්ධ වෛදිකයෝ ගංගා නිම්ණ කෘෂිකාර්මික සංස්කෘතියකට උරුමකම් කීහ. අර්ධ වෛදිකයන් සිංහල ජාතියේ දේශපාලන ආධිපත්‍යයට පත් වූ නමුත් වාපී කෘෂිකාර්මික සංස්කෘතිය සිංහල ජාතිය විසින් ද අනුගමනය කෙරිණි. එසේ කිරීමට හැකි වූයේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට වඩා එකල යටත්විජිතවාද වෙනස් වූ බැවිනි.

පැරණි යටත්විජිතවාද දේශපාලන ආධිපත්‍යය වටා භ්‍රමණය විණි. සංස්කෘතික ආධිපත්‍යය එයින් ඇතැම්විට ගලා එන්නක් පමණක් විය. එහෙත් දේශපාලන ආධිපත්‍යයට යට වූ ජනතාවගේ සංස්කෘතිය ඇතැම් විට දේශපාලන ආධිපත්‍යය ඇතිකළ ජනවර්ගයට හෝ ජාතියට හෝ ආරෝපණය විය. යක්ෂ ගෝත්‍රිකයන්ගේ වාපී කෘෂිකාර්මික සංස්කෘතිය අර්ධ වෛදිකයන්ට හා සිංහල ජාතියට හිමි වූයේ එලෙසිනි. මෙහි දී කිවයුත්තක් වෙයි. යක්ෂ වාපී සංස්කෘතියෙහි වැව් තැනුණේ තාවල්ලක් සහිත ජල පෝෂණයක් සහිත ප්‍රදේශයක ය. වැව් යා කරමින් ඇළවල් බැඳ ඇති නමුත් ගංගා ඔය හරස්කර වැව් බැඳීම යක්ෂ සම්ප්‍රදාය නො වි ය. එහෙත් අර්ධ වෛදිකයෝ පළමු වරට ඔයක් හරස් කර කලාවැව නිර්මාණය කළහ. එයින් වැව් තාක්ෂණය ඉදිරි පිම්මක් පැන්න නමුත් යක්ෂ ගෝත්‍රිකයන් එයට විරුද්ධ වී ඇති බව පෙනෙයි. ධාතුසේන රජු එසේ ඉදිරි පිම්මක් පැනීමෙන් නිර්මාණය කළ කලාවැව තම වස්තුව ලෙස සැලකීම පුදුමයක් නො වේ.

බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය අන්‍යොන්‍ය වශයෙන් බහිෂ්කාර නොවූ සංරචක තුනකින් සමන්විත වෙයි. ඒ දේශපාලන, සංස්කෘතික හා ආර්ථික යනුවෙනි. බටහිර යටත්විජිතවාදය මේ සියලු සංරචක යටත්විජිත වැසියන් වෙත පතුරවයි. මෙය ඉතා දැඩි මර්දනයක් යටත්විජිත වැසියා වෙත ඇතිකරන අතර ඒ එකිනෙක සංරචක අතර ඇති සම්බන්ධතා හේතුවෙන් ග්‍රැම්සිකි නම් මාක්ස්වාදියා කියා ඇති ආකාරයෙන් හෙජමනියක් ද ඇතිකරයි. හෙජමනිය දේශපාලන ආධිපත්‍යයකට වඩා ඉතා වැඩි දෙයකි. එහෙත් අප සඳහන් කරන සංරචක අතර සම්බන්ධයට වඩා අඩු දෙයකි. අද මෙරට ද සිටින ඇතැම් මාක්ස්වාදී පඬියෝ ඊනියා හෙජමනියක් ගැන කතාකරති. එහෙත් මේ හෙජමනියෙහි යම් සංස්කෘතික යටත්විජිතවාදයක් ද ඇති බව පඬියෝ තේරුම් නො ගනිති. ග්‍රැම්ස්කි වුව ද තේරුම් නොගත් දෙයක් නම් බටහිර දැනුම ද මේ යටත්විජිතවාදයෙහි කොටසක් බව ය. හෙජමනිය යන නොපැහැදිලි සංකල්පය වෙනුවට අපි අන්‍යොන්‍ය වශයෙන් බහිෂ්කාර නොවූ දේශපාලනික, සංස්කෘතික හා ආර්ථික යටත්විජිතවාදී සංරචකවලින් සමන්විත බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය යන සංකල්පය යොදාගනිමු.

කෙසේ වෙතත් වාපී කෘෂිකාර්මික සංස්කෘතියක් ඇතිකරගත් සිංහල ජාතියට විරුද්ධ වූ යක්ෂ ගෝත්‍රිකයෝ පඬුඅබා දවස සිට ම මෙරට ජීවත්වූහ. වංසකතාවල මේ ගෝත්‍රිකයන් අමතක කෙරෙයි. ඒ හේතුවෙන් ඇතැම් විට යක්ෂ ගෝත්‍රිකයන් ගැන සඳහන්විය යුතු තැන්වල දෙමළ යනුවෙන් සඳහන් වෙයි. එළාර රජු ආශ්‍රිත කතාව එවැන්නකි. එළාර නම් දෙමළ රජ කෙනකුට භාරතයේ දකුණු දෙසින් පැමින අනුරාධපුරය හතළිස් වසරක් පමණ පාලනය කිරීමට තරම් ශක්තිමත් දෙමළ වාංශික රාජ්‍යයක් එවකට භාරතයේ නො තිබිණි.

© Prof. Nalin De Silva

දෙමළ ජාතික රාජ්‍යයක් ලෝකයේ කිසිම තැනක කිසිම දිනෙක තිබී නැත. චෝලයන් දෙමළ වංශයක්, එනම් දෙමළ බස කතාකළ වංශයක් ලෙස සැලකිය හැකි ය. පාණ්ඩ්‍ය වංශය ද චේර වංශය ද එසේ ම ය. එහෙත් මෙහි දී සඳගන් කළ යුතු කරුණක් වනුයේ පාණ්ඩ්‍යයන් කලින් අර්ධ වෛදිකයන් වූ බව ය. පඬුවස් දෙව් කුමරු එසේ දකුණු භාරතයට උතුරෙන් පැන ආ අර්ධ වෛදික වංශයකට අයත්වූවෙකි. විජය රජුට මනාලියක් ගෙන ආවේ අර්ධ වෛදික පාණ්ඩ්‍ය වංශයෙන් මිස දෙමළ පාණ්ඩ්‍ය වංශයකින් නො වේ.

ද්‍රවිඩයන් භාරතයට පැමිණ ඇත්තේ ම ක්‍රිස්තු පූර්ව හයවැනි සියවසේ දී ය. එදා සිට ගැමුණු රජ දවස වන විට භාරතයේ ශක්තිමත් දෙමළ හෝ වෙනත් වර්ගයක හෝ ද්‍රවිඩ වාංශික බලවත් රාජ්‍ය ඇති වී නො තිබිණි. එළාර රජු යක්‍ෂ ගෝත්‍රිකයන්ට සම්බන්ධකම් තිබූ පැරණි පර්සියාව ප්‍රදේශයෙන් පැමිණි රජ කෙනකු වීමට ඇති ඉඩකඩ ඔහු දෙමළ රජකු වීමට ඇති ඉඩකඩ ට වඩා ඉතා වැඩි ය. එහෙත් වංසකතාවේ යක්‍ෂ ගෝත්‍රික ඉතිහාසය වසංකර ඒ වෙනුවට පැරණි යක්‍ෂ ගෝත්‍රිකයන් දෙමළ වැසියන් බවට පත්කෙරෙයි. මාගම සිට අනුරාධපුරයට ගිය ගැමුණු කුමරුට මහවැලි ගඟ තරණය කිරීමට පෙර බිඳීමට සිදු වූ බලකොටු තිස්දෙක යක්‍ෂ නොවී දෙමළ වන්නේ ඒ විධික්‍රමයට අනුව ය. එළාරට මෙහි පැමිණ එතරම් සුලු කාලයක දී මහවැලි ගඟෙන් එගොඩ, එනම් වත්මන් නැගෙනහිර පළාතේ (රුහුණේ) බලකොටු තිස්දෙකක් ඉදිකිරීමට හැකියාවක් තිබිණි ද? මේ අතර ගැමුණු කුමරු කොත්මලේ ගියේ එහි සිටි යක්‍ෂ ගෝත්‍රිකයන් තමන්ට පක්‍ෂපාති කරගැනීමට ය යනුවෙන්  ඒ ප්‍රදේශයෙහි ඇති ජනප්‍රවාදය අමතක නොකළ යුතු ය.

යක්‍ෂ ගෝත්‍රික ඉතිහාසය වෙනුවට දෙමළ ඉතිහාසයක් ලිවීමෙන් වංසකතා වක්‍ර ව නමුත් දෙමළ ජාතිවාදයට පැරණි ඉතිහාසයක් උරුමකර ගැනීමට අවස්ථාව සපයා ඇත. අද දෙමළ ජාතිවාදීන්ට මෙරට එළාර කාලයේ සිට ම වාසය කෙළේ යැයි කීමට සාධක නැතත් ඔවුහු වංසකතා ඇසුරෙන් එවැනි ඉතිහාසයක් නිර්මාණය කරති. එසේ නිර්මාණය කරන අතර ම වංසකතාවලට ද පහර දෙති. ඇතැම් දෙමළ ජාතිවාදීන් ලෝකයට කියන්නේ වෙනත් බෞද්ධයනට ඇත්තේ ත්‍රිපිටකයක් පමණක් නමුත් සිංහල බෞද්ධයනට මහාවංසය නමින් හතරවැනි පිටකයක් ද ඇති බව ය.

අප ඉදිරිපත්කරන සුසමාදර්ශයට අනුව පඬුඅබා දවස සිට ම සිංහල ජාතියට එරෙහි වූ යක්‍ෂ ගෝත්‍රිකයෝ මෙරට වාසය කළහ. ඔවුහු විටින් විට සිංහල ජාතියට හා රාජ්‍යයට අභියෝග කළහ. යක්‍ෂ ගෝත්‍රිකයෝ කලාකරුවෝ වූහ. දක්‍ෂ ශිල්පීහු වූහ. ඔවුන් සතු සංගීතයක් විය. මේ බොහෝ සංස්කෘතිකාංග ඔවුන්ගෙන් සිංහලයන්ට හිමි වී ඇත. ඒ අතර සිංහල ජාතියට නාග දේව ආදී ගෝත්‍රිකයන්ගෙන් උරුම වූ සංස්කෘතිකාංග ද වෙයි. යක්‍ෂ ගෝත්‍රිකයන් බලවත් ම වී ඇත්තේ කාශ්‍යප රජු කාලයෙහි ය. ඔවුහු පළමු වතාවට සිංහල රාජ්‍යයෙහි බලය ලබාගත්හ. කාශ්‍යප රජු මව් පාර්ශ්වයෙන් යක්‍ෂ ගෝත්‍රිකයකු වූ බව පැහැදිලි ය.

මහසෙන් රජු ද මව් පාර්ශ්වයෙන් යක්‍ෂ ගෝත්‍රයට අයත් වුවත් ඔහු ද රජ බවට පත්වුවත් ඔහුට සහාය දිය හැකි තරමේ යක්‍ෂ ගෝත්‍රික බලයක් තිබූ බවක් නො පෙනෙයි. කාශ්‍යප කුමරුට එවැනි බලයක් සහිත යක්‍ෂ ගෝත්‍රික පිරිසක් වූ බව පෙනෙයි. කාශ්‍යප රජු සිංහල රාජ්‍යය දහඅට වසරකට වුවත් අත්කර ගෙන ඇත. එහෙත් ඒ යක්‍ෂ ගෝත්‍රිකයන් බලය අත්කරගත් ප්‍රථම හා අවසාන අවස්ථාව විය. මුගලන් කුමරු භාරතයට පැනගොස් හමුදාවක් රැගෙන විත් කාශ්‍යප රජු පරදවා නැවතත් සිංහල රාජ්‍යයෙහි බලය තමන් අතට ගෙන ඇත. ඔහු එහි දී ඉතා දරුණු භීෂණ ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇති බව පැහැදිලි වන අතර ඉන්පසු යක්‍ෂ ගෝත්‍රිකයන්ට සිංහලයන්ට අභියෝග කිරීමට තරම් ශක්තියක් තිබී නැත. ඉන්පසු කෙමෙන් කෙමෙන් යක්‍ෂ ගෝත්‍රිකයන් සිංහල ජාතියට ඇතුල් වන්නට ඇත. අද වන විට එලෙස සිංහලකරණය වීම අවසාන අවස්ථාවට එළඹී ඇති බව පැහැදිලි ය.

මෙහි දී සඳහන් කළ යුතු වැදගත් කරුණක් නම් යක්‍ෂ ගෝත්‍රිකයන් වෙන ම රාජ්‍යයක් පිහිටුවා ගැනීමට උත්සාහයක් දරා නොමැති බව ය. ඔවුහු වැඩි ම වශයෙන් ගතහොත් සිංහල ජාතියට අභියෝග කරමින් සිංහල රාජ්‍යයෙහි වාසය කළෝ ය. වෙන ම රාජ්‍යයක් යන්න වත්මන් සංකල්පයක් යැයි කිසිවකුට කල්පනා විය හැකි ය. එහෙත් වෙන ම රාජ්‍යයක් පිහිටුවීමට අවශ්‍ය මූලික අනිවාර්ය එහෙත් ප්‍රමාණවත් නොවන කොන්දේසියක් වනුයේ යම් ජනවර්ගයක් හෝ ගෝත්‍රයක් හෝ ඉතා වැඩි වශයෙන් එක ප්‍රදේශයකට සීමාවීම ය. යක්‍ෂ ගෝත්‍රිකයෝ දිවයින පුරා විසිර සිටිය හ. එබැවින් ඔවුන්ට අදාළ අනිවාර්ය අවශ්‍යතාව සපුරාලීමට නො හැකිවිය. වත්මන් දෙමළ ජනයා ද දිවයින පුරා විසිරී සිටිති. ඔවුන්ට ද වෙන ම රාජ්‍යයක් පිහිටුවීම සඳහා මූලික අනිවාර්ය අවශ්‍යතාවවත් නැත.

© Prof. Nalin De Silva

අපේ අවධානයට ලක්විය යුතු තවත් කරුණක් වෙයි. පොම්පරිප්පුවේ හා වෙනත් තැන්වල හමු වී ඇති සොහොන් දෙමළ ජනයාගේ යැයි කීමට ඇතැම් පඬියෝ උත්සාහ කරති. එහෙත් ඒ සොහොන් දෙමළ ජනයා මෙරට ස්ථිර වාසස්ථාන නිර්මාණය කළා යැයි යාපනය විශ්වවිද්‍යාලයේ පළමු ඉතිහාස මහාචාර්යවරයා වූ ඉන්ද්‍රපාලන් මහතා පවසන දොළොස්වැනි සියවසට ඈත අතීතයේ තිබී ඇත. එවා අර්ධ වෛදිකයන් පැමිණීමට පෙර මෙරට විසූ ගෝත්‍රික ජනයාගේ බව පැහැදිලි ය. අර්ධ වෛදිකයන් පැමිණීමෙන් පසු ඒ සොහොන් ක්‍රමයෙන් අභාවයට යැමෙන් පෙනී යන්නේ එවා සිංහල ජාතියෙහි කිඳාබැසි නාග වැනි ගෝත්‍රික පිරිසකගේ හෝ පිරිස් කිහිපයක හෝ සොහොන් බව ය. යක්ෂ ගෝත්‍රිකයන් සිංහල ජාතිය සමග සම්පූර්ණයෙන් නොබැඳුණු බැවින් ඒ සොහොන් ඔවුන්ගේ වී නම් අර්ධ වෛදිකයන් පැමිණීමෙන් කලකට පසුව ද ඒ සොහොන් නිර්මාණය කළ යුතුව තිබිණි.

ඒ සොහොන්වල මුට්ටිවල මළ සිරුරු බහා ලා ඇත්තේ වක් ගැසුණු අයුරකින් වීම නිසා ඒ නාග ගෝත්‍රිකයන්ගේ වීමට ඉඩක් ඇත. නාග සංකේතයට අනුව දරණ ගසා සිටින අයුරට තරමක් වුවත් සමීප වන ආකාරයකට මළ සිරුරු වළදැමීමට ඔවුන් කල්පනා කළා විය හැකි ය. ඒ සොහොන්වල ඇති අකුරු බ්‍රාහ්මී අක්ෂර නොවන බැවින් ද ඒ අර්ධ වෛදිකයන් මෙරටට පැමිණීමට පෙර මෙරට වාසය කළ ගෝත්‍රයක් හෝ ගෝත්‍ර කිහිපයක් හෝ නිර්මාණය කළ සොහොන් වීමට ඇති ඉඩකඩ අධික ය. කෙසේ වෙතත් මේ සියලු කරුණු සම්බන්ධයෙන් තව තවත් ගවේෂණය කළ යුතු ය. වංසකතාවල සුසමාදර්ශයට වෙනස් සුසමාදර්ශයක් පදනම් කරමින් ඒ ගවේෂණය සිදු නොකළහොත් ඉන් අනිටු එල අත්වනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva